# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | |
|---|---|---|---|---|
| දිනය Date | 2025.01.16 පැය 1510 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 73 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2025.01.15 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගම්පහ පොලිස් වසමේ මාකවිට වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය 03 මිලි ග්‍රෑම් 400 ක් හා රු.56 ජීව පතරොම් 03 ක් අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ මකවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

ගම්පහ පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2025.01.15 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මීගොඩ පොලිස් වසමේ වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 600 ක් හා හෙරොයින් ග්‍රෑම් 02 මිලි ග්‍රෑම් 110 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වූ මීගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

මීගොඩ පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**03. බලපත්‍ර නොමැති මෙරට නිෂ්පාදිත ගිනිඅවි දෙකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ කඳවුර.**

2025.01.15 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පොතුවිල් පොලිස් වසමේ සෙංගමුව වෙල්යාය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 65 ක් වූ පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

පොතුවිල් පොලිස් ස්ථානය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**04. බලපත්‍ර නොමැති මෙරට නිෂ්පාදිත ගිනිඅවි දෙකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා ආරුගම්බේ කඳවුර.**

2025.01.15 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා ආරුගම්බේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පොතුවිල් පොලිස් වසමේ සෙංගමුව වෙල්යාය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 27 ක් වූ පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

පොතුවිල් පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. බලපත්‍ර නොමැති මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ නීති විරෝධි ලෙස වගා කර තිබූ ගංජා පැළ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා බුත්තල කඳවුර.**

2025.01.15 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්‍ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කතරගම පොලිස් වසමේ ලුණුගම්වෙහෙර රක්ෂිත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ නීති විරෝධි ලෙස වගා කර තිබූ ගංජා පැල 37550 ක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන කතරගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 55 ක් වූ තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.

කතරගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**